# මෙත්සිරි ද සිල්වා එ. ගාල්ල පොලිස් ස්ථානය

RTIC Appeal (**පුද්ගලික වශයෙන් විභාග කිරීම**)/ 891 /2019 (2019.03.19 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය)**,** රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අභියාචක** - මෙත්සිරි ද සිල්වා
**නොතිසි ලත් පාර්ශවය** - නම් කළ නිලධාරී, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, ගාල්ල පොලිස් ස්ථානය

**පෙනීසිටීම**

අභියාචක - මෙත්සිරි ද සිල්වා
පොදු අධිකාරිය - පෙනී නොසිටින ලදි

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.07.24 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | 2018.10.04 |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.08.23 |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | - |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2018.10.29 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක විසින් 2018.07.24 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත දැක්වෙන තොරතුරු ඉල්ලා සිටින ලදි.

*මේ සමඟ අමුණා ඇති අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති විසින් අංක 1763/2013 සහ 2013.06.11 දිනැතිව ගාල්ල මහ නගර සභාවේ හිටපු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙනුවෙන් වෛද්‍ය. කේ සිංහාරච්චි යන ය වෙත යවන ලද ලිපියෙහි සහතික කල පිටපතක් ලබා දෙන්න.*

තොරතුරු නිලධාරී විසින් 2018.10.04 දිනැතිව පිළිතුරු සපයමින් පවසා සිටින ලද්දේ අභියාචක විසින් යොමු කරන ලද තොරතුරු ලබාගැනීමේ අයදුම්පතෙහි සඳහන් අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති විසින් 2013.06.11 වන දිනැතිව යොමු කරන ලද අංක 1763/2013 දරන ලිපියේ පිටපතක් ලබා දෙන ලෙසට කර ඇති ඉල්ලීම අනුව අපරාධ විමර්ශන අංශය මගින් විමසීම් කල අතර, එම ලිපිය යොමු කර වසර 5ක කාලයක් ඉක්මවා ගොස් ඇති බැවින් ලිපියේ පිටපතක් අංශයේ නොමැති බවට වාර්තා කර ඇති බවයි. මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක විසින් 2018.08.23 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධාරියා නියමිත කාල සීමාව තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීම මත අභියාචක විසින් 2018.10.29 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

පොදු අධිකාරිය අභියාචනා විභාගයට පැමිණ නොමැති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරන ලදී.

පොදු අධිකාරිය විසින් කොමිෂන් සභාවේ පූර්ව දැනුම්දීමට ප්‍රතිචාර ලෙස ලිපියකින් දන්වා එවා ඇත්තේ අදාළ තොරතුරු ඉල්ලීම සම්බන්ධව ගාල්ල කොට්ඨාස සහකාර පොලිස් අධිකාරි ගාල්ල දිස්ත්‍රික් 1 මගින් වාර්තාවක් කැඳවූ බවත් ඒ අනුව අපරාධ විමර්ශන අංශය විසින් ඉහත ලිපිය යොමුකර මේ වන විට වසර 05ක කාලයක් ඉක්මවා ගොස් ඇති බැවින් එහි පිටපතක් එම අංශය සතුව නොමැති බව දන්වා එවා ඇති බවයි. එසේම මීට පෙරද මේ සම්බන්ධව 2018.10.10 දින මු.පො.ප./ ගාල්ල බැහැර අංක 1574/18 දරණ ලිපිය මඟින් හා 2018.10.15 දින මු.පො.ප./ගාල්ල බැහැර අංක 1605/18 දරණ ලියාපදිංචි තැපැල් ලිපිය මඟින් අභියාචක වෙත දන්වා ඇති බවත් ඒ අනුව අභියාචක විසින් ඉල්ලුම්කරන ලබන ලිපිය අපරාධ අංශය සතුව නොමැති බැවින් ලබා දීමට හැකියාවක් නොමැති බවයි.

**නියෝගය:**

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 15 (අ) වගන්තිය යටතේ පරීක්ෂණ පැවැත්වීමට හා එම පරීක්ෂණ සඳහා පෙනීසිටින ලෙස යම් තැනැත්තකු වෙත නියම කිරීමට තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවට බලතල ඇත.

ඉහත සඳහන් අභියාචනය සඳහා, පොදු අධිකාරිය, කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීමට නිකුත් කරන ලද නොතීසියට අනුව, කටයුතු කිරීමට අපොහොසත් වීම හේතුවෙන්, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39(1)(ඇ) වගන්තියට අනුව මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කොට රුපියල් පනස්දහසක් නොඉක්මවන දඩ මුදලකට හෝ අවුරුදු දෙකක කාලයක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම ලක් විය හැකිය.

ඒ අනුව පොදු අධිකාරිය නොපැමිණීම හේතුවෙන් කල් තබන ලද මෙම අභියාචනය සඳහා 2019.06.18 දින පැමිණන ලෙසට කොමිෂන් සභාව විසින් නියෝග කරනු ලැබේ.

මීළඟ අභියාචනා විභාගය: 2019.06.18

RTIC Appeal (**පුද්ගලික වශයෙන් විභාග කිරීම**)/ 891 /2019 (2019.06.18 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය)**,** රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

| | |
|---|---|
| **සභාපති:** | මහින්ද ගම්මම්පිල |
| **කොමිෂන් සභා සමාජික:** | ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන |
| **කොමිෂන් සභා සමාජික:** | ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා |
| **කොමිෂන් සභා සමාජික:** | විනිසුරු රෝහිණී වල්ගම |

| | | |
|---|---|---|
| **අභියාචක** | - | මෙත්සිරි ද සිල්වා |
| **නොතිසි ලත් පාර්ශවය** | - | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, ගාල්ල පොලිස් ස්ථානය |

**පෙනීසිටීම**

| | | |
|---|---|---|
| අභියාචක | - | මෙත්සිරි ද සිල්වා |
| පොදු අධිකාරිය | - | අනුරුද්ධ හක්මන, පොලිස් අධිකාරී, ගාල්ල |

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

අභියාචනය සඳහා දෙපාර්ශ්වයම පැමිණ ඇති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරන ලදි.

පොදු අධිකාරිය විසින් කරුණු දක්වා සිටියේ 2013.06.11 දිනැති ලිපිය මූලස්ථාන පොලිස් පරීක්ෂකට යොමුකර ඇති අතර ඔවුන් භාරයේ එම ලිපිය නොමැති බවට වාර්තා කර ඇති බවයි. එසේම තොරතුරු පොත් වසර පහක පමණ කාලයක් තබා ගන්නා බවත් ඊට අදාළ විමර්ශනයක් හෝ නඩු කටයුත්තක් නොමැති නම් එම පොත් විනාශ කරන බවත් සඳහන් කරන ලදි. එසේම සංචාරක පොතේ/රෙජිස්ටර පොතේ අදාළ තොරතුරු ඇත්නම් එය පරීක්ෂා කර බලා අභියාචක වෙත ලබා දිය හැකි බවට කරුණු දක්වන ලදි.

අභියාචක විසින් කරුණු දක්වන ලද්දේ අදාළ නිලධාරියා 2013 වර්ෂයේ සේවය කර ඇති නිසා එම පුද්ගලයාගෙන් ඊට අදාළ තොරතුරු ලබාගෙන තමා වෙත ලබා දිය හැකි දැයි විමසන ලදි.

මෙහිදී කොමිෂන් සභාව අවධාරණය කර සිටින ලද්දේ පොදු අධිකාරියක භාරයේ, සන්තකයේ හා පාලනයේ ඇති තොරතුරු ලබා දීමට පමණක් නියෝග කළ හැකිමුත් මේ වනවිට සේවයේ නොමැති අයෙකුගෙන් ඒ පිළිබඳව විමසීමට කටයුතු කළ නොහැකි බවයි. නමුත් පොදු අධිකාරිය ප්‍රකාශ කරන පරිදි සංචාරක පොත/රෙජිස්ටර පොත පරීක්ෂා කර බලා ඊට අදාළ තොරතුරු අභියාචක වෙත ලබා දීමට නියෝගයක් නිකුත් කළ හැකි බවට කොමිෂන් සභාව අවධාරණය කර සිටින ලදි.

**නියෝගය:**

ඒ අනුව පොදු අධිකාරිය කරුණු දැක්වූ පරිදි අදාළ සංචාරක පොත/රෙජිස්ටර පොත පරීක්ෂා කර අදාළ තොරතුරු ඇත්නම් එම තොරතුරු දෙසතියක කාලයක් තුළ අභියාචක වෙත ලබා දීමට, පොදු අධිකාරියට මින් නියෝග කරනු ලැබේ.

ඒ අනුව අභියාචනය මින් අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.
*****